**සිංහල පරිවර්තනය**

**උ. ප. රා. සේ. කො. ස. චක්‍රලේඛ අංක : 10/2021**

මගේ අංකය : **NP/07/10/01/159**
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය,
17.05.2021

ලේකම් පළාත් පාලන අමාත්‍යාංශය,
පළාත් ඉඩම් කොමසාරිස්,
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
උතුරු පළාත.

**උතුරු පළාත් තාක්ෂණවේදී සේවයේ ජනපද නිලධාරී IIIවන ශ්‍රේණියේ තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2021**

උතුරු පළාත් තාක්ෂණවේදී සේවයේ ජනපද නිලධාරී තනතුරට පවතින පුරප්පාඩු සංඛ්‍යා **හයක් (06)** සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පැවැත්වීමට නියමිත බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය **17.06.2021** වේ.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

*02.1* *2017.01.01* වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද **ජනපද නිලධාරී** සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මගින් නිර්දේශ කර ඇති කොන්දේසීන් වලට අනුකූලවද, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30**වන දරණ **2013.07.03**වන දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය අයත් ආයතන ක්‍රියාපටිපාටි සංග්‍රහය යනාදීන්ට යටත්ව, තෝරාගනු ලබන විභාග අපේක්ෂකයන් උක්ත තනතුරේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් පත්වීමට සුදුසුකම් ලබන අපේක්ෂකයන් පත්වීමේ දින සිට එක් වසරකට වැඩ බැලීමේ පරිවාස කාලයට යටත් කර **ජනපද නිලධාරී III වන** ශ්‍රේණියේ තනතුරට පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි උක්ත තනතුරේ **III වන** ශ්‍රේණියට පත් කළ දින සිට වසර තුනක් (03) ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි.

*02.3* මෙම සේවය ස්ථාන මාරුවලට යටත් වූ සේවයකි. එබැවින් මෙම පත්වීම ලබා ගන්නා අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයට සේවය කිරීමට බැඳී සිටිය යුතුයි. මෙම නියෝගයට නැමුරුව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුයි.

02.4 පත්වීම් සංඛ්‍යාව හා එය ක්‍රියාත්මක වන දිනය වැනි කරුණු යනාදිය පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. පත්කිරීමට නියමිත සංඛ්‍යාව **හයකි(06)**. එනමුත් නිවේදනය කරන ලද යම් පුරප්පාඩුන් හෝ පුරප්පාඩු සියල්ල සම්පූර්ණ නොකර සිටීමේ බලතල පත්වීම් බලධාරියා සතුය

## 03 වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක *03/2016* පරිදි, වැටුප් කාණ්ඩය, **MN 3 – 2016**ට අනුකූලව **ජනපද නිලධාරී III වන** ශ්‍රේණියේ තනතුරට ඒකාබද්ධ වැටුප් පරිමාණය රුපියල් **31, 040 – 10 x 445 - 11 x 660 - 10 x 730 – 10 x 750 – 57, 550/-**වේ . (රුපියල් 31,930 වැටුප් පියවරට එළඹීමට පෙරාතුව පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වී සිටිය යුතුයි)

## 04. සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුයි.

04.2 අයදුම්කරුවන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි ශාරීරික යෝග්‍යතාවයකින් සිටිය යුතුයි එමෙන්ම මනා චරිත.වත් පුද්ගලයකු ද විය යුතුයි.

04.3 අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට හෝ ඊට ප්‍රථම අයදුම්කරුවන් විසින් **සියලුම සුදුසුකම්** සපුරා තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-

### අ) අධ්‍යාපන සුදුසුකම් :-

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ/සිංහල/ඉංග්‍රීසි), ගණිතය හා විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සමග විෂයයන් හයකින්(06) සමත්වී තිබිය යුතුයි.

**ඒ සමගම**

### ආ) වෘත්තීය සුදුසුකම් :-

කුණ්ඩසාලෙයි, වවුනියාව, අම්පාර හාර්ඩි උසස් තාක්ෂණ විද්‍යාලයෙන් ලබාගත් අවුරුදු දෙකකට(02) නොඅඩු කෘෂිකර්ම ඩිප්ලෝමා හෝ ඊට සමගාමී වූ ඩිප්ලෝමා සුදුසුකමක් සපුරා තිබිය යුතුයි.

**හෝ**

තෘතියික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් හෝ අනුමත කරන ලද වෙනත් ආයතනයකින් උක්ත ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය මට්ටම - 06 (N.V.Q Level - 06) අයදුම්කරුවන් විසින් සපුරා තිබිය යුතුයි.

**ඒ සමගම**

### ඇ) සේවා පළපුරුද්ද :-

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉඩම් ක්ෂේත්‍ර උපදේශක III වන ශ්‍රේණියට අයත් තනතුරේ **වසර දහයක්(10)** සේවා පළපුරුද්දක් අයදම්කරුවන් සතුව තිබිය යුතු අතර, අයදුම්පත් අවසාන දිනට පෙරාතුව අවම වශයෙන් වසර **පහක්(05)** සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් තෝරාගනු ලැබේ.

### ඇ) වයස් සීමාව :-

සීමිත බඳවා ගැනීම් සඳහා උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

## 06. බඳවා ගැනීමේ ක්‍රමය :-

06.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් කුසලතා පදනම් කරගෙන, බඳවා ගන්නා අවස්ථාවේදී බලගන්වා ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටීන්, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදීන්ට අනුකූලව ජනපද නිලධාරී තනතුරට බඳවා ගනු ලැබේ. මෙම නිවේදනය මගින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බවට අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා ඇති අයිතිවාසිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් සියල්ල, ලේඛන යානදීන් පරීක්ෂා කරනු ලැබේ.

06.2 උක්ත තනතුරට අයදුම්කරන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන්, දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු වලට අදාළව පත්වීම් ලබාදීමට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

*06.1* පුරප්පාඩු වලින් *03%* ක් ආබාධිතයන් වෙනුවෙන් වෙන් කරනු ලැබේ. අපේක්ෂකයන් පත්වීම සඳහා තෝරා ගනු ලබන විට අදාළ තනතුරේ සේවය කිරීමට තම ආබාධිත තත්වය බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණය මගින් සනාථ කළ යුතුයි.. එසේ නමුත් විශේෂ අවශ්‍යතාවයන් හිමි අපේක්ෂකයෙකු පත්වීම් සඳහා සුදුසුකම් ලබන්නේ ලිඛිත විභාගයෙන් අවශ්‍ය ලකුණු ප්‍රමාණයක් ලබා ගතහොත් පමණයි.

## 07. විභාග ගාස්තුව :-

අයදුම්කරුවන් පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් ***500.00*** ක් වටිනා මුදලක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ තැන්පත් ගිණුම් අංකය වන ***"3401"*** ට ගෙවා එම කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නොගැලවෙන පරිදි අදාල කොටුවේ අලවා යොමු කළ යුතුයි. කුමණ හේතුවක් නිසා හෝ මෙම ගාස්තුව නැවත ගෙවනු නොලැබේ. එමෙන් ම මෙම ගාස්තුව වෙනත් කිසිදු විභාගයක් සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම් කිරීමේ ක්‍රමය:-

08.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 ප්‍රමාණයෙන් යුත් (සෙ.මී *21.x* සෙ.මී *29)* කඩදාසියේ *1* සිට 4.8 දක්වා වූ ජේද පළමු කොටසේ ද, 4.9 සිට 7.0 දක්වා ජේද දෙවන පිටුවටද ඇතුළත් වන පරිදි ද, ඉතිරි කොටස් අනෙක් පිටුවට ඇතුළත් වන පරිදි ද අයදුම්පත්‍රය සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 17.06.2021 වන දින හෝ ඊට ප්‍රථම ලබා ගත හැකි පරිදි, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

08.2 අයදුම්පත්‍රය යොමු කරන ලිපි කවරයේ වම් උඩ කෙළවරේ **"ජනපද නිලධාරී III වන ශ්‍රේණියේ තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2021"** යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය තොරතුරු සපුරා නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3 අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් තම භාරයේ තබා ගැනීමට ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හෝ පූර්ව නිශ්චිත පිටපත් භාර ගනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. **ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරුවන් සියලුම සුදුසුකම් සපුරා ඇති බවට අදහස් කිරමක් නොවන බව සැළකිය යුතුයි..**

08.4 අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර ලැබුණු බවට කිසිදු දැනුම් දීමක් නිකුත් කරනු නොලැබේ. එමෙන්ම අයදුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනට ප්‍රථම කැඳවා ඇති සුදුසුකම් සපුරා නැති අයදුම්පත්‍ර පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර ඒ පිළිබඳ කිසිදු දැනුම් දීමටක් නිකුත් කරනු නොලැබේ.

## 09. අනන්‍යතාවය ඔප්පු කිරීම :-

අපේක්ෂකයන් තමන් පෙනී සිටින සම්මුඛ පරීක්ෂණයේදී තම අනන්‍යතාවය තෘප්තිමත් වන පරිදි සනාථ කළ යුතුයි. අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එකක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු ගුවන් බලපත්‍රය.
(iii) වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින විට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභවේ ලේකම්වරයාගේ අභිමතය පරිදි ප්‍රතික්ෂේප කළ හැකිය. සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභවේ ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීතීන්ට අනුකූලව කටයුතු කිරීමට නැඹුරුවිය යුතුයී.

## 10. සාවද්‍ය තොරතුරු සඳහා දඬුවම්:-

අයදුම්පත්‍ර සම්පූර්ණ කරන විට අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු සැපයීමට වගබලා ගත යුතුයි. මෙම සම්මුඛ පරීක්ෂණ රීතීන්ට අනුව කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට ප්‍රථමයෙන් හෝ පසුව හෝ කුමණ හෝ අවස්ථාවකදී හෝ සුදුසුකම් සපුරා නැති බවට අනාවරණය වූවහොත් අපේක්ෂකත්වය සඳහා ඇති හිමිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. එමෙන් ම අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද කිසියම් තොරතුරක් සාවද්‍ය තොරතුරු බව අනාවරණ වන කුමණ අවස්ථාවකදී හෝ පළාත් රාජ්‍ය සේවයෙන් නෙරපා හැරීමට අවස්ථාව ඇත..

## 11. අත්සන සහතික කිරීම :-

**සියලුම අයදුම්කරුවන් තම අත්සන සහතික කිරීම අත්‍යාවශ්‍ය වේ.** අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් තම අත්සන සහතික කරගත යුතුයි.

## 12. සම්මුඛ පරීක්ෂණ සැලැස්ම :-

මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පහත සඳහන් විෂයයන් ඇතුළත් වනු ඇත.

| අංක | තෝරා ගන්නා ක්‍රමවේදය | ලකුණු | කරුණු |
|---|---|---|---|
| 01 | සේවා පළපුරුද්ද හා ජ්‍යෙෂ්ඨතාවය | 90 | සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සඳහා සෑම වසරකටම ලකුණු පහ(05) බැගින් ප්‍රදානය කෙරේ. එමෙන්ම මෙම සක්‍රිය හා සතුටුදායක සේවා කාලය මාස හය ඉක්මවූ නමුත් එක් වසරකට අඩුවෙන් අවධාරණය කරන විට එයට ලකුණු දෙකහමාරක්(2.5)ක් ප්‍රදානය කරනු ලැබේ. කෙසේ වුව ද මාස හයකට අඩු උක්ත සේවා කාලයට ලකුණු කිසිවක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 02 | සම්මුඛ පරීක්ෂණය | 10 | ආකල්පය, සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා පිළිතුරු දීමේ ආකාරය. |
| | **සම්පූර්ණ** | **100** | --- |

**13.** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා සතුය. මෙම නිවේදනය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් මගින් පළ කරන අතර භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පැන නගින අවස්ථාවක් වෙතොත් එම අවස්ථාවේදී දෙමළ මාධ්‍යයේ නිවේදනය පරිදි කටයුතු කළ යුතුයි.

**14.** මෙම නිවේදනය ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ සේවය කරන පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර උපදේශක තනතුරට අයත් නිළධාරීන්ගේ අවධානයට යොමු කරන්න.

**15.** උක්ත සම්මුඛ පරීක්ෂණය සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් අන්තර්ජාලයෙන් ලබාගත හැකිය.

**S. තිරුචාකරන්.**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,